**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ (අතිරේක මූල්‍යකරණ) ව්‍යාපෘතිය -2021 ජනවාරි 01 සිට ඔක්තෝම්බර් 15 දක්වා කාලසීමාව සඳහා**

-----------------------------------------------------------------------------------------------------------

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ (අතිරේක මූල්‍යකරණ) ව්‍යාපෘතියේ 2021 ජනවාරි 01 සිට ඔක්තෝම්බර් 15 දක්වා කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5768- එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි ණය සහ ප්‍රදාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසිවල 4:09(ආ) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ දේශගුණික අවදානම්වලට නිරාවර්තිත ජනයා හා වත්කම් ගොදුරුවීම් සඳහා නතුවීමට ඇති අවකාශය අවම කිරීම හා ආපදාවන්ට සඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ලබන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම යි. අතිරේක මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 6,048 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 42 ක් වන අතර මුළු මුදලම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවිණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝම්බර් 15 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

-------

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 ඔක්තෝම්බර් 15 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලසීමාව සඳහා වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් කළමනාකරණය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | (i) ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති අටක සියයට 05ක රඳවුම් මුදල් දෝෂ වගකීම් කාලසීමාව තුළ නිදහස් කර තිබුණි. රඳවුම් මුදල් වගකීම් සහතිකයේ වලංගු කාලය 2020 දෙසැම්බර් 01 දින කල් ඉකුත් වුවද, භෞතික විගණන | **ගිවිසුමේ විධිවිධාන ලබාදී ඇති පරිදි රඳවුම් මුදල් වගකීම් සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව සහ අරමුදල් සම්පාදක ආයතනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා රඳවුම් මුදල් නිදහස් කර ඇති ඇත.** | රඳවුම් මුදල් නිදහස් කිරීමට ප්‍රථම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි දෝෂ නිවැරදි කර නොතිබුණි. | | |
| | (ii) අදාළ තාක්ෂණික නිලධාරීන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඒ අනුව රඳවුම් මුදල් වගකීම් සහතිකයේ වලංගු කාලසීමාව දීර්ඝ කිරීමට නිර්දේශ කර තිබුණි. | රඳවුම් මුදල් වගකීම් සහතිකය නිදහස් කිරීමට පෙර කොන්ත්‍රාත්කරු විසින් ඔවුන්ගේ වියදමින් ඒවා නිවැරදි කර ඇත. | |
| (ආ) | එකඟ වූ ප්‍රමාණ බිලෙහි අවශ්‍ය පිරිවිතර අනුව මිමී. 150ක ඝනකමින් කොන්ක්‍රීට් කානුව පවත්වා නොගැනීම හේතුවෙන් ප්‍රධාන බෝක්කු හා කානු පද්ධති ඉදි කිරීම හා බාදනය වූ සෙල්ල කතරගම - කිරිවෙහෙර මාර්ගයේ දෙපස සංවර්ධනය කිරීම සඳහා එකතුව රුපියල් මිලියන 4ක ගෙවීම අත්හිටුවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලසීමාව 2021 ඔක්තෝම්බර් 31 දින කල්පිරී තිබුණ අතර, 2021 දෙසැම්බර් 15 දින දක්වා අදාළ දෝෂ නිවැරදි කර නොතිබුණි. ඉදිකිරීමේ ස්වභාවය මත මෙම දෝෂ නිවැරදි කළ නොහැකි තත්ත්වයක පැවතුණ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙය නොසලකා හැර මෙම අත්හිටවූ මුදල් රජයෙ ආදායමට බැර කරනු වෙනුවට ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමෙ තැන්පත් කර තිබුණි. | දෝෂ නිවැරදි කරන තුරු අත්හිටවූ මුදල් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. දෝෂ නිවැරදි කරන තත්ත්වයක් නොමැති හෙයින් තැන්පත් කරන ලද මුදල රජයේ ආදායමට බැර කරන ලදී. | අදාළ පාර්ශවයන්ගෙන් අනාර්ථික වටිනාකම අය කර ගත යුතුය. |
| (ඇ) | මුළු ප්‍රමාණ බිල්පත් වටිනාකම රුපියල් මිලියන 182.2ක් වූ කොන්ත්‍රාත් පැකේජ තුනක් රුපියල් මිලියන 30ක් ගෙවීමෙන් අනතුරුව 2017-2019 කාලසීමාව තුළ නතර කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අදාළ කොන්ත්‍රාත්කරුට එරෙහිව කටයුතු කර නොතිබුණු අතර, ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා විකල්ප මූල්‍ය වැඩපිළිවෙලක් හඳුන්වා දීමෙන් තොරව 2021 ඔක්තෝම්බර් 15 දින විදේශ ණය නිදහස් කිරීම වසා දමා තිබුණි. එබැවින්, රුපියල් මිලියන 39ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් ඉහත කොන්ත්‍රාත්තුව නතර කර තිබුණි. කොන්ත්‍රාත්තුව නතර කරන විට මුළු වැඩවලින් සියයට 3.9ක් සම්පූර්ණ කර ඇත.ඉතිරි වැඩ රුපියල් මිලියන 59.47ක වටිනාකමකට දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ස්වකීය සේවකයින් හා උපකරණ යොදවා ගනිමින් සිදු කර ඇති අතර, සියයට 95ක වැඩ අවසන්ව පැවතුණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික අයවැය යටතේ ඉතිරි සියයට 5ක වැඩ ඇතුළත් වේ. | අදාළ පාර්ශවයන්ගෙන් අනාර්ථික වටිනාකම අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූලා ගිවිසුම අනුව ගංවතුර අවදානම් අවම කිරීම යන සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 26ක් වෙන්කර තිබුණාද, ඉහත සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 27.39ක් වැය කර ඇත. එබැවින්, විධිමත් අනුමැතියකින් තොරව ඇමෙරිකානු ඩොලර් මිලියන 1.39ක් ඉක්මවා තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම කලින් කල සංශෝධනය වූ අතර, ලෝක බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. ප්‍රසම්පාදනයේ ක්‍රමානුකූල සෙවීමේ හුවමාරුව මගින් ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ලෝක බැංකුව අනුමැතිය ලබා දුන් විගසම ඉහත විචලනය සඳහා එය වලංගු අනුමැතියක් ලෙස පිළිගනු ලැබේ. | විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දුර්වල කොන්ත්‍රාත් වැඩ හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ අංක CRIP/AF/ WORKS/ID - AMP/NCB /97) හි අයිතම 2.3 යටතේ අක්කරෙයිපත්තු කොට්ඨාශයේ වීරගඩි ඒකකයේ කලිඹඩි අතිරේක පිටවුමේ රුපියල මිලියන 15ක් වැය කර ඉදිකරන ලද රැඳවුම් බැම්ම පුපුරා ඇති අතර අඟල් 03කින් පමණ ඉදිරියට තල්ලු වී තිබුණි. | ශක්තිමත් කළ ආරක්ෂක කොන්ක්‍රීට් බැම්මේ ඉදිකිරීම් සන්ධි දිගේ පිපිරුම් ගොඩනැගී ඇත. ස්ථාන 03කින් ශක්තිමත් කළ කදම්බ සමඟ දෙපස සිරස් බැම් බැඳ ඇත. කොන්ත්‍රාත්කරු විසින් එය සම්පූර්ණයෙන්ම නිවැරදි කර ඇත. වර්තමානයේ තවදුරටත් පලුදුවීම් වර්ධනය නොවේ. | අදාළ පාර්ශවයන්ගෙන් හානි අයකර ගත යුතුය. |
| (ඊ) | සමන්තුරේ කොට්ඨාශයේ නෙල්ලිකාඩු ජලාපවහන ඇළේ නෙල්ලිකාඩු පළමු හා දෙවන අමුණ හා සී-බී ඇළ කොටස ජේ ඒකකය වැඩිදියුණු කිරීම යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 2.3ක් වූ බිංදු ව්‍යුහ 07 සහ පෙට්ටි බෝක්කු 01 සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් විය. මෙය නොසලකා වැඩ සම්පූර්ණ කිරීම නිකුත් කර තිබුණි. එබැවින්, කොන්ත්‍රාත්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු නොවීය. | අවාසනායකට ජලාපවහන ගඟ නිසා ජලාපවාහන ඇළ බොහෝ වේලාවට ගලායාම පැවතුණි. තවද, බිංදු ව්‍යුහ සී6 ඇළේ ඉදිකළ යුතුව ඇති අතර ජල ප්‍රශ්නය පවතින කාලයේදී අදාළ ඉදිකිරීම සිදුකිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි විය. බොහෝ අවස්ථාවල අවාරයේ පවා ඉතා තද වැසි පැවතුණි. ව්‍යාපෘතිය අවසන් වීමට ප්‍රථම බිංදු ව්‍යුහ කඩිනම් කිරීමට හෝ සම්පූර්ණ කිරීමට සත්‍ය වැඩබිම් තත්ත්වය අයහපත් විය. | අදාළ පාර්ශවයන්ගෙන් අනාර්ථික වටිනාකම අය කර ගත යුතුය. |
| (උ) | ඌව පළාත්බඳ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ නායයාම් බෑවුමේ අසාර්ථකවීම් නිවැරදි කිරීමේ වැඩවලට අදාළව ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත් පැකේජ 03 ගිවිසුම් කාලසීමාව තුළ සම්පූර්ණ කර නොතිබුණි. කෙසේවුවද, ඇපකර බැඳුම්කරය ලබා ගැනීමෙන් පසුව සහතික කළ අසම්පූර්ණ වැඩ සඳහා එකතුව රුපියල් මිලියන 11ක් ගෙවා තිබුණි. ඇපකර බැඳුමකරය 2021 මැයි 31 දින කල් ඉකුත් වුවද, කොන්ත්‍රාත්කරු විසින් ඉතිරි වැඩ සම්පූර්ණ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉතිරි වැඩ සම්පර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට බලපෑම් කළ යුතුය. |